ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

President of Sri Lanka

# රට බරපතල තත්වයකට පත්ව ඇත

ත්‍රිකුණාමලයේ නාවික කඳවුර හා වරායට එල්ල වී ඇති වැඩිවන තර්ජන සහ රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව අතිගරු ජනාධිපතිතුමිය විසින් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත 2003 සැප්තැම්බර් 12 වැනිදා යොමු කරන ලද ලිපිය.

BiKT . 0103
25 . 08 . 2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**2003 - 09 - 12**

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
අග්‍රාමාත්‍ය,
අග්‍රාමාත්‍ය කාර්යාලය,
කොළඹ 03.

හිතවත් අග්‍රාමාත්‍යතුමනි,

## ත්‍රිකුණාමලයේ නාවික කඳවුර හා වරායට එල්ල වී ඇති එල්. ටී. ටී. ඊ. තර්ජනය

පසුගිය තෙමසක කාලය තුළදී ඉහත කී විෂය සම්බන්ධයෙන් බොහෝ සාකච්ඡා හා අදහස් උදහස් පළ වී ඇත. අදාල බලධාරීන්ගෙන් මේ පිළිබඳ යථා තත්ත්වය පැහැදිලි කරගනිමින් සහ අවශ්‍ය පූර්ව ආරක්ෂක පියවර හා සැළසුම් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන අතරම මම මේ සියල්ල නිශ්ශබ්දව බලා සිටියෙමි. රාජ්‍යය පිළිබඳ ඉතාමත් වැදගත් කාරණා සම්බන්ධයෙන් ඔබත්, ඔබේ මාධ්‍ය ප්‍රකාශක ජී. ඇල්. පීරිස් මහතාත්, විසින් කරන ලද ප්‍රකාශවල ගැබ්වී ඇති රාජ්‍ය තාන්ත්‍රිකභාවයේ හා විචක්ෂණභාවයේ අඩුව දැකීමෙන් මා විශ්මයට පත්වූ බැවින් අවසානයේදී මේ ලිපිය ඔබ වෙත ලිවීමට තිරණය කළෙමි.

මේ ප්‍රශ්නයට අදාල කරුණු කෙටියෙන් ගෙනහැර දැක්වීමට මම උත්සාහ දරමි.

දැනට මාස කිහිපයක සිටම ත්‍රිකුණාමලය නාවික කඳවුර හා වරාය අවට පිරිහෙමින් පවත්නා ආරක්ෂක තත්ත්වය පිළිබඳව නොයෙකුත් වාර්තා මා වෙත ලාබී ඇත. ත්‍රිකුණාමලයේ ආරක්ෂක තත්ත්වය පිළිබඳව විශේෂයෙන්ම කඳවුරු ආදී ස්වරූපයෙන් එළිදැක ඇති එල්ටීටීඊ සන්නද්ධ කණ්ඩායම් රැඳී සිටීම පිළිබඳව විශ්ලේෂණාත්මක තොරතුරු මා වෙත ඉදිරිපත් කරන ලෙස ත්‍රිකුණාමලයේ ආරක්ෂාව සහතික කිරීමේ කාර්යභාරය හාරව සිටින යුධ සහ නාවික හමුදාපතිවරුන්ගෙන් මෙයට මාස දෙකකට උඩදී මම ඉල්ලා සිටියෙමි. මෙම ඉල්ලීම නියමාකාරයෙන් ඉටුකරනු ලැබිය.

එහිදී පැහැදිලි කරනු ලැබූ කරුණු මෙසේය.

✯ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමෙන් පසු, දැන් බෙහෙවින් කථා බහට ලක්වී ඇති මනිරාසකුලම් කඳවුර ද ඇතුළුව කඳවුරු 13ක් ඉදිකරනු ලැබ තිබුණි.

✯ මෙම කඳවුරු පිහිටුවා ඇත්තේ ත්‍රිකුණාමල වරාය වටකළ හැකි ආකාරයකටය. එල්ටීටීඊය සතුව ඇතැයි කවුරුත් දන්නා ඈතට විදිය හැකි කාලතුවක්කු වලින් පහසුවෙන් පහරදිය හැකි ආකාරයෙන් මෙම කඳවුරු පිහිටුවා ඇත.

✯ සත්‍ය අවබෝධ කර ගැනීමට කැමැත්තක් දක්වන සියලුදෙනා ද දන්නා පරිදි එල්ටීටීඊ සංවිධානය සතුව වරායේ දකුණු කොටසේ මායිමට වන්නට

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ඉලන්කන්තායි හි විශාල මුහුදු කොටි කඳවුරක් ඉදිකර ඇත. ප්‍රහාරයක දී ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික යාත්‍රාවලට පහරදීමේ අරමුණින් එල්ටීටීඊ මරාගෙන මැරෙන මුහුදු කොටින් සහිත බෝට්ටු මෙම කඳවුරට රැගෙන ආ හැකිය.

එල්ටීටීඊ සංවිධානය ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවල ජිවත්වන අයට පහර නොදී මුත්තූර් ප්‍රදේශයේ ජිවත් වන මුස්ලිම්වරුන්ට පමණක් දිගින් දිගටම පහර දෙන්නේ මන්දැයි බොහෝ ශ්‍රී ලාංකිකයෝ අසති. මුත්තූර් ප්‍රදේශයේ ත්‍රිකුණාමල වරාය ආසන්නයේ පිහිටි උපක්‍රමික වශයෙන් බෙහෙවින් වැදගත් වන්නා වූ ප්‍රදේශයකි. එහි ඇති විවිධ වූ ගොඩනැගිලි හා වෙනත් පහසුකම් ත්‍රස්තවාදී නාවික හමුදා කඳවුරක් පිහිටුවීමට සුදුසුය. අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව එල්ටීටීඊ සංවිධානය මගින් ත්‍රිකුණාමලය වටකර පිහිටුවන ලද කඳවුරු වළල්ලට මුත්තූර් ප්‍රදේශය බාධාවකි.

ත්‍රිකුණාමලයේ ආරක්‍ෂක තත්ත්වය පිළිබඳව පැහැදිළිවම අනතුරු අඟවමින් ආණ්ඩුවට භාරදී ඇති විවිධ වූ වාර්තා අතරින් වැදගත් වාර්තා දෙකක් ගැන මම මෙහිදී සඳහන් කරමි.

උතුරු හා නැගෙනහිර ආරක්‍ෂක තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කොට වාර්තා කිරීම සඳහා ඇමෙරිකානු ශාන්තිකර කලාපිය ආඥා අධිකාරියේ විශ්ලේෂක කණ්ඩායමකට ආණ්ඩුව පසුගිය වසරේදී ආරාධනා කළ බව ඔබ වරක් මා වෙත දැන්විය. 2002 සැප්තැම්බර් / ඔක්තොම්බර් කාල සීමාවේදී ශ්‍රී ලංකාවට පැමිණි මෙම කණ්ඩායම 2002 නොවැම්බර් මාසයේදී ඔබට වාර්තාවක් ඉදිරිපත් කළේය.

"ත්‍රිකුණාමල වරායේ ආරක්‍ෂාව පිළිබඳව ප්‍රශ්න" යන මැයෙන් වූ එම වාර්තාවේ වැදගත් කොටස් කිහිපයක් මම උපුටා දක්වමි. එල්ටීටීඊ සංවිධානය මේවනවිට වරායෙන් දකුණු දිග කොටස පාලය කරයි . මෙම ප්‍රදේශයේ සිට එල්ටීටීඊ සංවිධානය වරායේ පිටත හා ඇතුලත සියලු නාවික ගමනා ගමනය හොඳින් නිරීක්‍ෂණය කරයි. එසේම නාවික කඳවුරට මරාගෙන මැරෙන ප්‍රහාර සහ කාලතුවක්කු ප්‍රහාර එල්ලකළ හැකි අතර. වරායට ඇතුළුවන හා වරායෙන් පිටවන ඕනෑම නෞකාවක් විනාශ කිරීමේ හැකියාව ද ඔවුන්ට ඇත. මෙම ප්‍රදේශ සම්බන්ධ වගකිම ශ්‍රී ලංකා යුධ හමුදාවට පැවරී ඇතත් එය සම්පූර්ණයෙන්ම ආරක්‍ෂා කරගැනිමට ඔවුන් අපොහොසත්වී ඇත. මෙම නොහැකියාවට එකම හේතුව එල්ටීටීඊ සංවිධානය සතුටු කරනු සඳහා ශ්‍රී ලංකා හමුදා එසේ කිරීමෙන් වැළකිය යුතු බවට ඔබ බලකර සිටීමය. ශ්‍රී ලංකා ආරක්‍ෂක හමුදා මෙම ගොඩබිම් ප්‍රදේශය අනිවාර්යයෙන් රැකගත යුතුය. පවත්නා ආරක්‍ෂක තත්ත්වය ශ්‍රී ලංකා නාවික යාත්‍රා බල ඇණියට අතිශයින්ම හානිකර විය හැකිය. එහි ප්‍රතිඵලය වනු ඇත්තේ යාපනය අර්ධද්වීපය සඳහා වන සැපයුම් කොළඹින් එවීමට සිදුවීමය. ත්‍රිකුණාමලයේ සිට යාපනයට ඇති දුර ප්‍රමාණය මෙන් සිව් ගුණයකින් වැඩිදුර ප්‍රමාණයක් මග ගෙවමින් මෙම සැපයුම් ලබාදිමට සිදුවනු ඇත. මෙම ප්‍රදේශය පාලනය සියතට ගන්නේ නැතිව ත්‍රිකුණාමල වරාය හා ඒ අවට ආරක්‍ෂාව හැමවිටම පරාජිත සටනක් බවට පත්වනු ඇත. ත්‍රිකුණාමල වරායේ පාලනය නොමැති නම් එය යුද්ධයක් කරගෙන යාමට ඇති හැකියාවට හානිකර ලෙස බලපානු ඇත. ශාන්තිකර කලාපිය ආඥා අධිකාරි විශ්ලේෂක කණ්ඩායම නිර්දේශ කර ඇති පරිදි මෙම ගොඩබිම ප්‍රදේශය ආරක්‍ෂා කර ගැනිමට ඔබ විසින් මොනම අකාරයක කිසිදු ක්‍රියාමාර්ගයක් වත් ගනු ලැබ නැත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ශ්‍රී ලංකා යුද හමුදාපතිවරයා විසින් මෑතකදී ආරක්ෂක ඇමතිවරයා වෙතත්, මා වෙතත්, ඉදිරිපත් කරන ලද වාර්තා කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි. අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව එල්ටීටීඊ සංවිධානය අලුත් කඳවුරු 12ක් පිහිටුවා ඇතිබව එම වාර්තාවේ පැහැදිලිව සඳහන් කරයි. මීට අමතරව අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමට පෙර පිහිටුවා තිබූ තාවකාලික එල්ටීටීඊ කඳවුරු 5ක් දැන් නිත්‍ය කඳවුරු බවට පරිවර්තනය කර ඇත. එසේනම් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව එල්ටීටීඊ කඳවුරු පිහිටුවා නැතැයි ඔබ පවසන්නේ කෙසේද?

ඔබ විසින් කරන ලද ප්‍රකාශයක් ලෙස සඳහන් කරමින් 2003 සැප්තැම්බර් 05 වැනි සිකුරාදා ලංකාදීප පුවත්පතේ පළවූ වාර්තාවේ සඳහන් කරුණු සන්නද්ධ හමුදා ප්‍රධානීන් විසින් මා වෙත සැපයූ කරුණු වලට සම්පූර්ණයෙන්ම පටහැනිය. ඔබ ප්‍රකාශ කර ඇතැයි වාර්තා වී ඇති එම කරුණු නම්,

- ☆ ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරට හා වරායට එල්ටීටීඊයෙන් තර්ජනයක් නැත.

- ☆ සටන් විරාම ගිවිසුම අත්සන් තැබීමෙන් පසු එල්ටීටීඊය කඳවුරු කිසිවක් පිහිටුවා නැත.

- ☆ ත්‍රිකුණාමලයට එල්ලවී ඇතැයි කියන ඊනියා අනතුර සම්බන්ධයෙන් වාර්තා කළ නැගෙනහිර නාවික හමුදා අණදෙන නිලධාරියෙගේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට ආණ්ඩුවට අවශ්‍යව ඇත.

* ආරක්ෂක හමුදා මගින් සම්පාදනය කරනු ලබන සයිලු වාර්තා භාරදිය යුත්තේ ආරක්ෂක ලේකම්වරයාට පමණී.

මෙයින් හැඟි යන්නේ රාජ්‍යයේ හා ආණ්ඩුවේ නායිකාවද ත්‍රිවිධ හමුදා ප්‍රධානියාද වන ජනාධිපතිනියට යුධ කටයුතු පිළිබඳව මෙම වාර්තා නොයැවිය යුතු බවයි.

ඔබ විසින් නිවැරදි කර නැති නිසාත් සැප්තැම්බර් 11 පැවති මාධ්‍ය හමුවේදී පිරිස් අමාත්‍යවරයා එම කරුණු යළි සනාථ කොට ඇති නිසාත් මෙම ප්‍රකාශය නිවැරදි යැයි මම විශ්වාස කරමි.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මා මෙතෙක් රැකි නිහඬතාව බිඳ දැමීමට කාලය එළඹ ඇතැයි මම විශ්වාස කරමි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍යයේත්, එහි ජනතාවගේත් ස්වෛරීභාවය සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමේ සියලු වගකීම් දරන්නාවූ පුද්ගලයා ලෙස ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වෛරීභාවයට හා ආරක්ෂාවට අතිශය වැදගත් කමකින් යුක්තවන්නාවූ ත්‍රිකුණාමල නාවික කඳවුරේ සහ වරායේ ආරක්ෂක තත්ත්වය ව්‍යාජ ආවරණයකින් වසා තබමින් සහ ඒ පිළිබඳව වැරදි හැඟීමක් නිර්මාණය කිරීමේ අරමුණින් ඔබත් , ඔබේ මාධ්‍ය ප්‍රකාශකයාත්, ආරක්ෂක අමාත්‍යවරයාත් කරන අසත්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට හා ජාතික ආරක්ෂාවට අතිශයින් වැදගත් වන බැවින් ඒ පිළිබඳ ප්‍රශ්නය මතුකිරීමට මට සිදුවී තිබේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

සත්‍ය තත්ත්වය මම මෙහි පහත ගෙනහැර දක්වමි.

ත්‍රිකුණාමලයේ එල්ටිටිඊ කඳවුරු පිහිටුවා ඇත්තේ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමට කලින් බවට ඔබ කර ඇති ප්‍රකාශය ආරක්ෂක අංශ මගින් මාවත සපයන ලද තොරතුරු වාර්තාවලින් සම්පූර්ණයෙන්ම නිශේධනය වෙයි.

ත්‍රිකුණාමලය නාවික කඳවුරු හා වරායට එල්ලවී ඇති බරපතල ආරක්ෂක තර්ජනය මෙන්ම මේ අවස්ථාවේදී එම ආරක්ෂක තත්ත්වය තවදුරටත් පිරිහීමට ඉඩදෙමින් ඔබත්, ආරක්ෂක අමාත්‍යවරයාත්, අනුගමනය කරන නොසැළකිලිමත් ක්‍රියාකලාපය කෙරෙහි මා කොතරම් කණස්සල්ලට පතවුයේද යත් මේ සම්බන්ධයෙන් මාගේ විදේශ කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයාට හා ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශකවරයාට තවදුරටත් කරුණු පැහැදිලි කරන්නැයි හමුදාපතිවරුන්ගෙන් මම ඉල්ලා සිටියෙමි. මා එසේ කළේ ඒ අන්දමින් තොරතුරු ලබාගැනිමෙන් පසු තත්ත්වය පිළිබඳ මා වෙත වාර්තා කිරීමට හා මා දැනුවත් කිරීමට ඔවුන්ට අවස්ථාව ලැබෙන බැවිණි. හමුදාපතිවරුන් විසින් ජනාධිපතිනියගේ ජ්‍යෙෂ්ඨ උපදේශකයින්ට තොරතුරු ලබාදෙනු ලැබුවේ මන්දැයි ප්‍රශ්න කරමින් ප්‍රකාශ නිකුත් කිරීමට කළින්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව කියවා බලන ලෙස ඔබේ ප්‍රකාශක ජි. ඇල්. පීරිස් මහතාට උපදෙස් දිය යුතුව ඇත.

තත්ත්වය සම්බන්ධයෙන් ඔබට හෝ ඔබේ ආරක්ෂක අමාත්‍යවරයාට තොරතුරු දන්වා නැතැයි ප්‍රකාශක කිරීම සම්පූර්ණයෙන්ම වැරදිය. ඔබ ත්‍රිකුණාමලයේ චාරිකාවක් කළ

අවස්ථාවේදී ආරක්ෂක තත්ත්වය පිරිහිම ගැනත්, එල්ටීටීඊ කඳවුරු ඉදිකිරීම ගැනත්, නිලධාරීන් 200ක් පමණ ඉදිරිපිටදී මාරපන හා මොරගොඩ යන ඔබේ අමාත්‍යවරුන්ට කරුණු පැහැදිලි කළ බව නාවික හමුදා ප්‍රකාශකයා 2003 අප්‍රේල් මාසයේදී ප්‍රකාශ කොට ඇත. පසුව මේ ප්‍රශ්නය සම්බන්ධයෙන්ම මීට සති කිහිපයකට උඩදී ඔබටත් ඔබේ ආරක්ෂක අමාත්‍යවරයාටත් නැවත වරක් අරලිය ගහ මන්දිරයේදී දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කර දී ඇත. අගෝස්තු මාසයේදී ආරක්ෂක අමාත්‍යවරයා ත්‍රිකුණාමලයේ චාරිකා කළ අවස්ථාවේදී ත්‍රිවිධ හමුදා ප්‍රධානින් ඉදිරිපිට ආරක්ෂක නිලධාරීන් විශාල පිරිසක් විසින් මේ බව ඔහුට දැනුම් දෙනු ලැබීය. එබැවින් මෙම සියලු කරුණු ඔබ ප්‍රතික්ෂේප කිරීම ගැන මම කම්පනයට පත්වෙමි.

ඊට අමතරව ආරක්ෂක ලේකම්වරයා, ත්‍රිවිධ හමුදා ප්‍රධානින් පොලිස්පතිවරයා සහ මගේ ලේකම්වරයා ආදි නිලධාරීන් සහභාගිවූ ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීම් කිහිපයකදීම ත්‍රිකුණාමලයේ ආරක්ෂාව පිළිබඳ මෙම ප්‍රශ්නය කිහිප විටක්ම මම මතුකොට ඇත්තෙමි. මෑතදී පැවති ආරක්ෂක මණ්ඩල රැස්වීමකදී ත්‍රිකුණාමලය ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයාට මම බරපතල ලෙස අනතුරු ඇඟවීමි. ඔබ සමග මෙම ප්‍රශ්නය ගැන බරපතල ලෙස සාකච්ඡා කොට මෙම කඳවුරු ඉවත් කිරීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා ලෙස මම ඔහුට උපදෙස් දුනිමි. මා එසේ කළේ මෙම කඳවුරු ඉවත් කිරීමට ශ්‍රී ලංකා සටන් විරාම කමිටුව දැරූ උත්සාහයන් සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ඇති නිසාය.

2003 අගෝස්තු 21 වැනි දා මා ඔබ වෙත එවූ මාගේ ලිපියෙන් මා මේ ප්‍රශ්නය මතුකර ඇත්තෙමි. එහි මෙසේ සඳහන් වේ. " ස්වකීය තීරණය ක්‍රියාත්මක කිරීමට ඇති නොහැකියාව ශ්‍රී ලංකා සටන්විරාම කම්ටුව පිළිගෙන ඇත. තීන්දුවක් ක්‍රියාත්මක කිරීමෙහිලා ඔවුන් මෙහෙයවනවා විනා අදාල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු යාන්ත්‍රණයක් සටන් විරාම කම්ටුවට නැත...." "එබැවින් මෙම කඳවුර ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවේ අධිකාරී බලය වහාම යෙදවිය යුතු යැයි මම යෝජනා කරමි."

එල්ටීටීඊ සංවිධානය යළි සන්නද්ධවීම සහ උපක්‍රමික වශයෙන් යළි ස්ථානගතවීම පිළිබඳව මෑතදී පැවති ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීමක දී මා ආරක්ෂක අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න කළවිට මාරපන අමාත්‍යවරයා කළ ප්‍රකාශයෙන් මම කම්පනයට හා විමතියට පත්වීම. ඔහු කියා සිටියේ ආරක්ෂක හමුදා අලුතින් සන්නද්ධ වන බැවින් එල්ටීටීඊය යළි සන්නද්ධවීමේ අවශ්‍යතාව අප අවබෝධ කරගත යුතු බවයි. ශ්‍රී ලංකා ස්වෛරී රාජ්‍යයේ නීත්‍යානුකූල හමුදාවත් ත්‍රස්තවාදී සංවිධානයක නීති විරෝධී සන්නද්ධ හමුදාවත්, එකම නීත්‍යානුකූල හා සදාචාරාත්මක සමාන පදනමක ලා සැලකීමට ඔබත් ඔබේ ඇතැම් අමාත්‍යවරුනුත් ක්‍රියාකරන්නේ ද?

මෙය මෑතදී පැවති ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලදී මාරපන අමාත්‍යවරයා කළ විෂමය ජනක සහ වගකීමකින් තොර ප්‍රකාශවලින් එකක් පමණකි.

කරුණු ගණනාවක් සම්බන්ධයෙන් ඔබත්, ආරක්ෂක අමාත්‍යවරයාත්, ත්‍රිවිධ හමුදා ප්‍රධානින් හා අදාල රජයේ නිලධාරීන්

සමග මා කිහිපවිටක්ම සාකච්ඡා කොට ඇති අතර, අවශ්‍ය උපදෙස් ලබා දී ඇත්තෙමි. එසේම මතු කියැවෙන කාරණා සම්බන්ධයෙන් ඔබටත්, ආරක්‍ෂක අමාත්‍යවරයාටත් ලිඛිතව උපදෙස් දී ඇත්තෙමි.

* අධි ආරක්‍ෂිත කලාප

* සටන් විරාම ගිවිසුම අත්සන් කළදා සිට එල්ටීටීඊය විසින් එල්ල කරන ලද ප්‍රහාර 13 කට ලක්වූ නැගෙනහිර මුස්ලිම්වරුන් ගේ ආරක්‍ෂාව සහතික කිරීමේ අවශ්‍යතාව.

    * ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ දේශපාලඥයින් ඝාතනය කිරීම.

    * දෙමළ ඊළාම් අධිකරණ පද්ධතියක් පිහිටුවීම.

    * ඊළාම් පොලිසියක්, ඊළාම් බැංකු පද්ධතියක් සහ බදු එකතු කිරීමේ ක්‍රමයක් පිහිටුවීම.

    * ළමුන් බලහත්කාරයෙන් යුධ සේවයට බඳවා ගැනීම.

    * ශ්‍රී ලංකා හමුදා සෙබලුන් ඝාතනය කිරීම.

    * එල්ටීටීඊය මගින් අවි ආයුධ හොරෙන් ගෙන එනු ලැබීම.

මේ තත්ත්වය වැළැක්වීමට මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

ඔබේ පාර්ශවයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බැවින් තත්ත්වයට පිළියම් යෙදීම සඳහා සන්නද්ධ හමුදා ප්‍රධානීන් සමග කෙලින්ම කටයුතු කිරීමට මට සිදුවී ඇත.

රාජ්‍යයේ හා ජනතාවගේ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමේ වගකීම හුදෙක් ඔබට පමණක් අයිති කාරණයක් වන අතර, එවැනි වැදගත් කරුණක් සම්බන්ධයෙන් මා විසින් ඉටුකළ යුතු කාර්යභාරයක් නැතැයි යන විශ්වාසයක් ඇති කිරීමට ඔබ උත්සාහ දරන බවක් පෙනේ.

2003 අගෝස්තු 28 වැනිදා ඔබ මා වෙත එවූ ලිපියෙන් කොටසක් ගෙනහැර දක්වමි. " පූර්ණ ආරක්ෂාව පවත්වාගෙන යමින් සාමය සඳහා ක්‍රියාකිරීමේ වගකීම සම්බන්ධයෙන් මේ රටේ ජනතාව ආණ්ඩුවට වරමක් ලබාදී ඇති බව මම හැම විටම විශ්වාස කරමි. අප කෙරෙහි ජනතාව තැබූ මෙම විශ්වාසය සපුරාලීමට මම අධිෂ්ඨාන කරගෙන සිටිමි..." "මෙවැනි අවස්ථාවක දේශපාලන වාසි ලබාගැනීමේ පදනමින් ක්‍රියාකිරීම නිවැරදි ක්‍රියා මාර්ගය නොවන බව මගේ අදහසයි."

රාජ්‍යයේ ස්වෛරීභාවය හා ආරක්ෂාව ආණ්ඩුව සහතික කළයුතු යැයි බලකර සිටීම "දේශපාලන වාසිය පිළිබඳ ප්‍රශ්නයක් " ද ? ඔබ ඔබේ ප්‍රකාශ ඇත්ත වශයෙන්ම විශ්වාස කරන්නේ නම්,

රටේ වැදගත්ම ප්‍රශ්නය මෙතරම් ලිහිල්ව සළකන අග්‍රාමාත්‍යවරයකු සිටීමේ කණගාටුදායක තත්ත්වයකට රට පත්ව ඇති බව ප්‍රකාශ කිරීමට මට සිදුවීම ගැන මම බලවත් සේ කණගාටු වෙමි.

අග්‍රාමාත්‍යතුමනි, ඔබ ද අමාත්‍යවරයෙකුව සිටි එක්සත් ජාතික පක්‍ෂ ආණ්ඩුව විසින් සකස් කොට සම්මත කරගන්නා ලද 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සුපරික්‍ෂාකාරීව කියවන ලෙස ඔබට නිර්දේශ කිරීමට මම කැමැත්තෙමි.

උපදෙස් පමණක් දෙන අතරතුර මෙතුවක් කලක් මේ තත්ත්වය දෙස මා විමසිල්ලෙන් බලාසිටීමට එකම හේතුව නම් අපේ ව්‍යවස්ථාව යටතේ රාජ්‍යයේ, ආණ්ඩුවේ හා කැබිනට් මණ්ඩලයේ විධායක නායකයා වන ජනාධිපතිනියට පමණක් පවරා ඇති ආණ්ඩුවේ විධායක බලතල පාවිච්චි කිරීමට ඔබට ඉඩ දෙන ලෙස ඔබ නිරන්තරයෙන් කළ ඉල්ලීමය. 2001 මැතිවරණ සමයේ දි ඔබ රටට පොරොන්දු වූ පරිදි බලයට පත්වී " මුල් දින 100 තුළ දි " රටේ ප්‍රශ්න විසඳීමට ඔබට කාලයක් ලබාදීම සඳහා මම ඊට එකගවීමි. 1999 ජනාධිපතිවරණ ව්‍යාපාරයේදි එල්ටීටීඊ සංවිධානය මා ඝාතනය කිරීමට උත්සහා දරා තිබියදීත්, විශාල ජනවරමකින් පිට පිට දෙවන වතාවටත් රටේ ජනතාව විසින් මා වෙත භාරකරන ලද ශුද්ධ වූ වගකීම මොහොතකට හෝ මම අමතක නොකරමි. දෙවන වතාවේදි ද පරාජිත අපේක්‍ෂකයා වුයේ ඔබය.

රට ඉදිරියේ ඇති විනාශයෙන් එය ගලවා ගැනීමේ අරමුණින් ඔබටත්, ඔබේ අමාත්‍යවරුන්ටත්, උපදෙස් දීමට මා කිහිපවිටක්ම උත්සාහ දරා ඇති බවට ඔබ එකඟ වනවා ඇත. මා

එසේ කළේ සහජීවන ආණ්ඩුවක් පවත්වාගෙන යෑමේ අවසාන ප්‍රයත්නයක් හැටියටය.

මේ කරුණු සම්බන්ධයෙන් මගේ එකම ස්වාමීවරුන් වන ජනතාව දැනුවත් කිරීමට කාලය එළඹ ඇතැයි මම විශ්වාස කරමි. මතු කියැවෙන කරුණු අනුව ඔබ රට බරපතල තත්ත්වයකට පත්කොට ඇතැයි ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

- ☆ පළමුකොට, රාජ්‍යයේ හා එහි ජනතාවගේ ආරක්ෂාව සහතික නොකිරීම.

- ☆ දෙවනුව, මාධ්‍ය වාර්තා කර ඇති පරිදි ත්‍රිකුණාමලයේ හා වෙනත් ප්‍රදේශවල බරපතල ආරක්ෂක තත්ත්වය පිළිබඳව ජනතාව හා කැබිනට් මණ්ඩලය හිතාමතාම නොමග යැවීම.

- ☆ තුන්වනුව, ඔබත් එල්ටීටීඊ සංවිධානයත් මගින් සකස් කොට අත්සන් තබන ලද දෝෂ සහිත වූ අවබෝධතා ගිවිසුම පවා කෙලින්ම උල්ලංඝණය කිරීමටත්, ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වෛරීභාවයට හා භෞමික අඛණ්ඩතාවයට තර්ජනය කිරීමටත් සන්නද්ධ කණ්ඩායමක් වන එල්ටීටීඊ සංවිධානයට ඉඩකඩ සළසමින් සාම ක්‍රියාදාමය කිසිදු සැළැස්මක් හෝ වෘත්තියවේදීත්වයකින් තොරව ඉදිරියට ගෙනයාම.

- ☆ ආරක්ෂක හමුදා ප්‍රධානින් සම්බන්ධයෙන් ඔබ කර ඇති විවිධ වූ වගකීමෙන් තොර ප්‍රකාශ දුෂ්කර

තත්ත්වයන් යටතේ ස්වකීය කාර්යභාරයන් ඉටුකිරීමට උත්සාහ දරමින් සිටින ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්ට සිදුකළ අසාධාරණයක් පමණක් නොව සමස්ත ආරක්ෂක හමුදාවලම ධෛර්‍යය හීනකරවීමට හේතු වන්නේය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මේ අනුව,

- ත්‍රිකුණාමලයේ ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය තත්ත්වය වසන් කිරීමෙන් හා විකෘති කිරීමෙන් වැලැකී සිටින ලෙසද,

- ස්වකීය වගකීම් ඉටුකිරීම වලක්වාලමින් හමුදාපතිවරුන්ට අපහාස කිරීමෙන් හා හිරිහැර කිරීමෙන් වලකින ලෙසද,

- මගේ ප්‍රධානත්වයෙන් පවත්වන ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලට නොවරදවා සහභාගිවන ලෙසද,

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය හා අරක්ෂක තත්ත්වයට හානිකර වන්නාවූ සියලු ක්‍රියාකාරකම්වලින් ඉදිරියේදී වැළකී සිටින ලෙසද, මම ඔබෙන් ඉල්ලා සිටිමි.

මෙයට, හිතවත්,

**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග**

**ගරු ජනාධිපතිනිය**

2003 - 09 - 12

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
පුස්තකාලය

"

...උපදෙස් පමණක් දෙන අතරතුර මෙතුමන් කලක් මේ තත්ත්වය දෙස මා මීමසිල්ලෙන් බලාසිටීමට එකම හේතුව නම් අපේ ව්‍යවස්ථාව යටතේ රාජ්‍යයේ, ආණ්ඩුවේ හා කැබිනට් මණ්ඩලයේ විධායක නායකයා වන ජනාධිපතිනියට පමණක් පවරා ඇති ආණ්ඩුවේ විධායක බලතල පාවිච්චි කිරීමට ඔබට ඉඩ දෙන ලෙස ඔබ නිරන්තරයෙන් කළ ඉල්ලීමය. 2001 මැතිවරණ සමයේ දී ඔබ රටට පොරොන්දු වූ පරිදි, බලයට පත්ව "මුල් දින 100 තුළ දී" රටේ ප්‍රශ්න විසඳීමට ඔබට කාලයක් ලබාදීම සඳහා ඊට මම එකඟවීමි. 1999 ජනාධිපතිවරණ ව්‍යාපාරයේදී එල්ටීටීඊ සංවිධානය මා ඝාතනය කිරීමට උත්සාහ දරා තිබියදීත් විශාල ජනවරමකින් [illegible] දෙවන වතාවටත් රටේ ජනතාව විසින් මා වෙත භාරකරන ලද ශුද්ධ වූ වගකීම [illegible] හෝ එය අමතක නොකරමි. දෙවන වතාවේදී ද පරාජිත අපේක්ෂකයා වූයේ ඔබය.

රට ඉදිරියේ ඇති විනාශයෙන් එය ගලවා ගැනීමේ අරමුණින් ඔබටත්, ඔබේ අමාත්‍යවරුන්ටත්, උපදෙස් දීමට මා කිහිපවිටක්ම උත්සාහ දරා ඇති බවට ඔබ එකඟ වනවා ඇත. මා එසේ කළේ සහජීවන ආණ්ඩුවක් පවත්වාගෙන යෑමේ අවංක ප්‍රයත්නයක් හැටියටය.

මේ කරුණු සම්බන්ධයෙන් මගේ එකම ස්වාමිවරුන් වන ජනතාව දැනුවත් කිරීමට කාලය එළඹ ඇතැයි මම විශ්වාස කරමි. පහත කියැවෙන කරුණු අනුව ඔබ රට බරපතල තත්ත්වයකට පත්කොට ඇතැයි ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

"

කොළඹ 10, ඩාලි පාර, අංක 301 [illegible]
[illegible] මුද්‍රණාලයේ මුද්‍රණය කර පළ කරන ලදී.